දුරකථන ... தொலைபேசி இல./Telephone Nos.

| | | |
|---|---|---|
| අමාත්‍ය... அமைச்... Ministe... | } | 2784832<br>2784807<br>2785617 |
| ලේකම් செயலா... Secre... | } | 2784812 |
| කාර්... அலுவலகம் Office | } | 2785141-50<br>Fax: 2784846 |

ඊමේල්/ஈ – மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය
உமது இல.
Your No. } ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாயா'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය
எமது இல.
My No. } ED/01/101/04/03/03-i

දිනය
திகதி
Date } 2017.07. 17


**චක්‍රලේඛ අංක - 28/2017**

**පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,**

**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**

**කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**

**පළාත්/ කලාප ගණිත විෂයය භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,**

**විදුහල්පතිවරුන් වෙත,**

## ගණිත විෂයය පත්වීම් නොලැබ ගණිත විෂයය ඉගැන්වීමේ යෙදෙන ගුරුවරුන් සඳහා වන ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතිකපත්‍ර ගුරු පුහුණු පාඨමාලාව

ගණිත විෂයය සඳහා පත්වීම් නොලැබ පාසල් පද්ධතියේ ගණිත විෂයය ඉගැන්වීමෙහි නියැලෙන ගුරුවරුන්හට විධිමත් පුහුණුවක් ලබාදීම පිණිස අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය එක්ව **"ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතිකපත්‍ර ගුරු පුහුණු පාඨමාලාවක්"** ක්‍රියාත්මක කර ඇත.

2.0 එම පාඨමාලාව සඳහා ජාතික අධ්‍යාපන ආයතනය මඟින් ඇගයීම් පරීක්ෂණයක් පවත්වන අතර, ඉන් සමත්වන ගුරුවරුන් සඳහා සහතිකපත්‍රයක් පිරිනමනු ලැබේ.

3.0 මෙම ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිමකරනු ලබන ගුරුවරුන් සඳහා පමණක් මෙම චක්‍රලේඛයේ විධිවිධාන බලපැවැත්වේ.

3.1 මෙම ගුරුවරුන්ගේ පත්වීම් විෂයය වෙනත් විෂයක් වුවද, පාසලකින් පාසලකට ස්ථානමාරු වීමේදී ගණිත විෂයය ගුරුවරයෙකු ලෙසම සැලකිය යුතුය.

3.2 මෙම ගුරුවරුන් නියමිත කාල සටහන සහිතව 10 -11 ශ්‍රේණි වල ගණිත විෂයය උගන්වනු ලබන්නේ නම් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) ගණිත විෂයය පිළිතුරු පත්‍ර ඇගයීම සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලත් අයෙකු ලෙස සලකා විදුහල්පති විසින් අදාල නිර්දේශයන් සැපයිය යුතුය.

4.0 මෙම පාඨමාලාව සඳහා ගුරුවරුන් නම් කිරීමේදී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් නිර්දේශ කළ යුතු අතර, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂක විසින් සහතික කළ යුතුය.

5.0 නිර්දේශ කරනු ලබන ගුරුවරුන් පහත සුදුසුකම් සපුරා තිබිය යුතුය.

5.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිත විෂයය සඳහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

5.2. 6 -11 ශ්‍රේණි වල ගණිත විෂයය ඉගැන්වීම අඛණ්ඩව වසර 5 ක් හෝ ඊට වැඩි සේවා කාලයක් සපුරා තිබීම.

6.0 අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ 42/2012 ප්‍රකාරව විශේෂ අධ්‍යාපනය සඳහා පත්වීම් ලද ගුරුවරුන් මෙම ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා නිර්දේශ නොකල යුතුය.

7.0 "ගණිතය ඉගැන්වීම පිළිබඳ උසස් සහතිකපත්‍ර ගුරු පුහුණු පාඨමාලාව" දැනට හදාරා ඇති සියලුම ගුරුවරුන් සඳහාද, ඉදිරියේදී මෙම පාඨමාලාව හදාරන ගුරුවරුන් සඳහාද, මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාළවන අතර, මෙම චක්‍රලේඛයේ පැන නගින ඕනෑ ම ගැටලුවක් සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:-

1. විභාග කොමසාරිස් ජනරාල්
2. විගණකාධිපති
3. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)
4. අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැළසුම් හා කාර්යසාධන සමාලෝචන)
5. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
6. ප්‍රධාන මුල්‍ය නිලධාරි
7. අධ්‍යාපන අධ්‍යක්ෂ (සැළසුම්)
8. ලේඛනාගාරය